
කුරුලු පැංචා
ටී. යෙනුමි නෙහන්සා රූපසිංහ

# කුරුලු පැංචා ...

## යෙනුමි නෙහංසා රූපසිංහ



ප්‍රථම මුද්‍රණය : 2023
කර්තෘ :යෙනුමි නෙහන්සා රූපසිංහ
ලිපිනය : නො. 227,
රජපිහිල්ල මාවත ,
මහනුවර
ISBN : 978-624-206-947-0
ප්‍රකාශිත දිනය : 2023 .11. 15

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01



# පිදුම


මාගේ සෙවනැල්ල ලෙසින් පිටුපසින් සිටිමින්
නිතරම මා දිරිමත් කරන
මාගේ අම්මාටත්, තාත්තාටත් ,
අත්තම්මා, අත්තා සහ මල්ලිටත් ,
මා හට නිතරම මග පෙන්වමින්,
මා නිසි මගට යොමු කරන,
මාගේ දයාබර ගුරු මෑණියන් වන,
සමන්මලී ගුරුතුමිය ටත්
ඉතා සෙනෙහසින් පුදමි.



# ස්තුතිය

මෙම පොත් පිංච නිර්මාණය කිරීමට
මා හට නන් අයුරින් සහය දැක්වූ
සැමදෙනාටම
මාගේ ගෞරවනීය ස්තූතිය පුදමි....





අදත් වෙනදා වගේම හිමිදිරි උදෑසන

මම අවදි වුණේ කුරුල්ලන්ගේ කිචි බිචි නාදෙන්..

හැමදාම උදේට අපේ ගෙදරට එක එක වර්ගයේ කුරුල්ලො එනවා.

පොල්කිච්චන්, කහ කුරුල්ලන්, ගේ කුරුල්ලන්, දෙමළිච්චන්,

පැණි කුරුල්ලෝ ඒ වගේම චූටි චූටි බට්ටිච්චෝ ගොඩායි..

එයාලා කෑ ගහනකොට හරිම මිහිරි ශබ්දයක් තමයි ඇහෙන්නේ..





CS CamScanner

දවසක් මම දැක්කා

ගේ කුරුල්ලෝ ඇවිල්ලා අපේ ගෙදර

කූඩුවක් හදන්න තැනක් හොයනවා.





ඉතින් මම තාත්තට කිව්වා,

අපි කුරුල්ලන්ට ඉන්න මුට්ටියක් එල්ලමු කියලා .

ඉතින් ගෙදර එළියෙ නිශ්ශබ්ද තැනක අපි මුට්ටියක් එල්ලුවා....

ටික දවසකින් මම දැක්කා


ගේ කුරුලු ජෝඩුවක් ඇවිල්ලා

මුට්ටියෙ කූඩුවක් හදන්න දේවල් අරගෙන එනවා..

ඒ දෙන්නා ගේ හදාගෙන

සතුටින් ඒ ගෙයි සති කිහිපයක් ජීවත් වුණා...






ටික දවසකින් මට ඇහුණා

මුට්ටිය ඇතුලේ චූටි කුරුලු පැටියෙක් හඬක්..

අනේ එයාලට දැන් පැටියෙකුත් ඉන්නවා.

මට හරිම සතුටුයි.......



ඒත් පහුවදා හදිසියෙන්ම මට ඇහුණා

මේ කුරුලු ජෝඩුවයි,පැටියයි එක දිගටම කෑගහනවා.


මම දුවලා ගිහින් බැලුවා.

අනේ, නපුරු කපුටෙක් ඇවිල්ලා පැටියා ව කන්න

කූඩුව වටේ කැරකෙනවා.



CamScanner



පැටියගෙ අම්මයි තාත්තයි

දුකෙන් සහ බයෙන් කෑගසමින් කූඩුව වටේ පියාඹනවා.



CamScanner

ඒත් කපුටා නම් යන පාටක් නෑ ..

මම තාත්තට කතා කරා.

තාත්තා මේක දැකලා ඉක්මනට ගිහිල්ලා කපුටා එලෙව්වා.

අනේ ඒ කුරුලු අම්මයි තාත්තයි අපි දිහා බලන් හිටියේ ස්තුතියි කියනවා වගේ.




තව දින කිහිපයක් ගෙවුනා.

කූඩුව පැත්තේ සතුටු හිතෙන කුරුළු සිංදු ඇහුණා...

මම ගිහිල්ලා බැලුවා.

අනේ කුරුලු පැටියත් එළියට ඇවිල්ලා.

එයා පියඹන්න වගේ හදන්නේ.




කුරුලු අම්මයි තාත්තයි දෙපැත්තෙ ඉදන්

පැටියට උදව් කරනවා.

මට හරියට අපේ අම්මයි තාත්තයි මට උදව් කරනවා වගේ කියලා හිතුණා.

පැටියත් එක්ක පොඩි දුරක් පියඹලා ගිහිල්ලා තුන් දෙනාම අහපහු ආවා...





පුන්චි කුරුලු ගීතයක් කියලා

තුන්දෙනාම ඇතට ඉගිලිලා

ගියේ හරියට මට ස්තුතියි කියනවා වගේ.....

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය බිස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .



මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

